052912
2015/07/21
MLIPR
D - 826

# සන්නියකුමෙහි අන්තර්ගත
# සමාජ
# සන්නිවේදන ලක්ෂණ

# නිබන්ධ සාරාංශය

සන්නියක්ෂයා මූලික කොට පවත්වනු ලබන පුදපූජා ඇතුළත් ශාන්තිකර්මය සන්නියකුම* හෙවත් දහඅට සන්නිය නමින් හැඳින්වේ. එය ප්‍රාදේශීය විශේෂතා සහිතව ව්‍යාප්තව ඇතත්, අලංකාර රංග විධීන් සහිතව ප්‍රාසංගික ලක්ෂණයෙන් පවතින්නේ පහතරට පළාතේ දී ය. මාතර, බෙන්තර, රයිගම් / සියනෑ කෝරළ ආදී වශයෙන් ප්‍රාදේශීය විශේෂතා රැසක් දක්නට ලැබෙන මෙහි අන්තර්ගත රංග ශෛලින්, ඇඳුම් පැළඳුම්, සැරසිලි ක්‍රම, පුදපූජා, වත්පිළිවෙත්, වෙස් මුහුණු, උපත් කථා ගායනය හා වාදනය ආදිය මගින් කිසියම් සමාජ සන්නිවේදන ක්‍රියාවලියක් එක්ව ඇති අයුරු විමර්ශනය කිරීමේ දී හෙළිදරව් කෙරේ. සන්නිවේදනයේ ප්‍රධාන කාර්යභාරය වන අදහස් හුවමාරු කර ගැනීම මෙම ශාන්තිකර්මය ආශ්‍රිතව ද පවතී. ශාන්තිකර්ම පුරාකථා ක්‍රමිකව මහජනයා අතරට එක්වීමත් සමග අදාළ පූජාවිධි රටා ඉදිරිපත් කිරීමේ දී භාවිත පෙළපාලි භාව ප්‍රකාශන ක්‍රම පසු කාලීනව සන්නිවේදනමය වශයෙන් සමාජ හැසිරීම්වලට බලපා ඇත.

ඒ අනුව සන්නියකුම හා සිංහල සමාජය පිළිබඳ, මූලාශ්‍රය ගත තොරතුරු, ජනශ්‍රැති ආශ්‍රිත සන්නිවේදනය, යකුන්, දෙවියන් හා පූජාවස්තු ආශ්‍රිත සමාජ සන්නිවේදන ලක්ෂණ, වාචික හා ව්‍යංගාර්ථ සන්නිවේදන ලක්ෂණ, රඟමඩුලු සැරසිලි හා රංගභාණ්ඩ මගින් පිළිබිඹුවන සන්නිවේදන ලක්ෂණ, පූර්ව හා පශ්චාද් චාරිත්‍ර විධි ආශ්‍රිත සන්නිවේදනය, වෙස් මුහුණු හා ඇඳුම්පැළඳුම්, නර්තන පෙළපාලි ආශ්‍රිත සන්නිවේදන ලක්ෂණ, බෞද්ධාගමික සන්නිවේදන ලක්ෂණ ආදී විවිධ සන්නිවේදන පැතිකඩ මෙහිලා අවධානයට ලක්කර ඇත.

ඒ අතර සන්නියකුම් යාගය පිළිබඳව දෙස් විදෙස් වියතුන් විසින් ඉදිරිපත්කර ඇති කරුණු සැලකිල්ලට ගෙන පරිපූර්ණ පර්යේෂණයක් කිරීමට මෙමගින් අදහස් කෙරේ. සන්නියකුම ශාන්තිකර්මය ග්‍රාමීය පුද පූජා ඇතුළත් වත්පිළිවෙත් ක්‍රමයක් පමණක් නොව ශාස්ත්‍රීය සමාජ මෙහෙවරක් මෙන්ම මානසික චිකිත්සක ක්‍රියාවලියක් ද ඉටු කෙරෙන බව පැහැදිලිය. එබැවින් එකී විශේෂත්ව හා ඉන් පිළිබිඹුවන සමාජ සන්නිවේදන ලක්ෂණ පිළිබඳ කරුණු සනාථ කිරීම මෙම නිබන්ධනයෙහි ලා උත්සුක වීමු.

---

* සන්නියකුම, සන්නියකා යන නාම භාවිතය ලේඛන ව්‍යවහාරයේ දී සන්නි යකා, සන්නි යකුම යනුවෙන් ද භාවිතව පැවතුණ ද අපගේ මෙම පර්යේෂණ ග්‍රන්ථය සඳහා සන්නියකා, සන්නියකුම යනුවෙන් මෙහිලා යොදා ගත් බව සැලකුව මනාය.